**හාලිඇල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
----------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 14 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 30 දින ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට හාලිඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී තොග හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබිණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම් බිල්කිරීම රු.5,000,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.4,723,719 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා රු.276,281 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ විවිධ ණය හිමියන්ගේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.1,817,998 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ මුද්දර ගාස්තු වටිනාකම රු.2,686,482 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 ශේෂය 2016 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ඒමේ දී හිඟහිටි මුද්දර ගාස්තු ආදායම් ලෙස වැඩිපුර රු.3,686,482 ක් ගිණුම් ගතකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ හිඟ වරිපනම් රු.49,531 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව තිබුණි.

(ඊ) දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු පොලී ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල රු. 147,714 ක් වැඩිපුර ඇතුලත්ව තිබුණි.

(උ) ඖෂධ තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.674,695 කින් වැඩියෙන් දැක්වුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ හා කරත්ත වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.182,150 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(එ) පසුගිය වර්ෂයේ විගණන වාර්තාව අනුව පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සභාවට ලබාදෙන ලද බහුකාර්ය ජංගම කුටි 10 ක වටිනාකම වූ රු.265,000 ක් ගිණුම්ගත නොකිරීම නිවැරදි කර නොතිබිණි.

1.3.3 **නොසැසඳූ පාලන ගිණුම්**

----------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂයන් හා අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳීමේ දී වටිනාකම රු. 18,262,171 ක වෙනසක් නිරූපනය වී තිබුණි.

1.3.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 81,770,113 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 55,037,652 ක් විය.

1.3.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු. 80,045,748 ක් වටිනා ගිණුම් විෂයන් 06 ක් සඳහා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපණය / සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 **නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

---------------------------------------------------

| **නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(xi) වගන්තිය | ඇටම්පිටිය සම්පත් මධ්‍යස්ථානයේ පිහිටි හිස් ඉඩම බදු දීමේ දී අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව වාර්ෂික බද්ද රු.6,000 කට ලබාදී තිබුණි. |
| (ආ) ගෝඝාතක ආඥා පනතේ III වන පරිච්ඡේදයේ 21 වගන්තිය | අමාත්‍යවරයාගේ ගැසට් නිවේදනයකින් තොරව ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාමට හා මස් ප්‍රවාහනය කිරීම සඳහා සභාව විසින් බලපත්‍ර ලබාදී තිබුණි. |
| (ඇ) III වන පරිච්ඡේදයේ (22) සූතිකාගාර පාලකයකුගේ හා | ගෝඝාතකාගාරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා වගන්තිය සම්පාදනය කොට නොතිබූ අතර,ගවයන් ඝාතනය මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයකුගේ අධීක්ෂණයට භාජනය වී නොතිබුණි. |
| (ඈ) II වන පරිච්ඡේදයේ 4 වන | ගව ඝාතනය කිරීමට පෙර ඉල්ලුම් පත්‍රයක් වගන්තිය මඟින් අවසර ගෙන නොතිබුණි. |
| (ඉ) 1980 අංක 47 දරන ජාතික පනතේ 23 "අ" වගන්තිය | ගෝඝාතක ස්ථානයක් සඳහා පරිසර බලපත්‍රයක් පාරිසරික ලබාගෙන නොතිබුණි. |
| (ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු. රෙ. 142(1) | හාලිඇල ප්‍රාදේශීය සභාවේ ඇටම්පිටිය ඉඩම කුලියට දීමේ දී විධිමත් තක්සේරු වාර්තාවක් ලබාගෙන නොතිබුණි. |
| (ii) මු. රේ. 371 | අවස්ථා 09 කදී කර්මාන්ත සඳහා දෙන ලද එකතුව රු.871,514 ක් වූ අත්තිකාරම් වලට අදාල කර්මාන්ත ඉටු නොකර තිබුණු අතර එම මුදල් අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | මු. රෙ. 1645 | 268 වැනි ආකෘති අනුව වාහන 04 ක දෛනික ධාවන සටහන් පත් ක්‍රමානුකූලව නඩත්තු කර විගණකාධිපති වෙත එවා නොතිබුණි. |
| (උ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ආයතන සංග්‍රහයේ වන පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | සේවය අත්හිටවූ හා මියගිය නිලධාරීන් 15 ජනරජයේ දෙනෙකුගෙන් රු.155,013 ක ණය වටිනාකමක් XXIV අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 41/90 | සභාව සතු රථවාහන 04ක් සම්බන්ධව ඉන්ධන ධාවනය පිළිබඳ පරීක්ෂාවක් කර නොතිබුණි. |
| (එ) | පළාත් පාලන කොමසාරිස්ගේ ජුනි 30 දිනැති අංක 12/1/1 තිබුණි. | මාසික ඉන්ධන සීමාව ඉක්මවමින් රු.97,945 ක් 2016 වටිනා ඉන්ධන ලීටර් 1031 ක් භාවිතා කර දරන ලිපිය |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,891,090 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,962,499 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයන්ට අදාලව ප්‍රාදේශීය සභා අරමුදලට ලැබිය යුතු හිඟහිටි ආදායම රු.5,928,420 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල ආදායමෙන් රු.1,680,767 ක් එනම් සියයට 35.5 ක් එදිනට හිඟව පැවතුණි.

(ආ) හිඟ ජල බිල්පත් රු.1,444,819 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 **වෙනත් ආදායම්**

**ප්‍රචාරක දැන්වීම් පුවරු වෙනුවෙන් ගාස්තු අයකිරීම**

දැන්වීම් පුවරු 15 වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි.

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ සහ මුද්දර ගාස්තු රු.12,576,283 ක් පළාත් සභාවෙන් අයකරගත යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

ප්‍රාදේශීය සභාවට අයිති වෙනත් පාර්ශවයකට බදු දෙනලද ඉඩම සඳහා හිඟ බදු කුලිය 2016 දෙසැම්බර් 31 වන විටද අයකරගෙන නොතිබුණි. එම ඉඩම හාලිඇල ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සඳහා පියවර ගන්නා ලෙස පළාත් පාලන කොමසාරිස් දන්වා තිබුණද එසේ කටයුතු කර නොතිබුණි.

3.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

ග්‍රාම සංවර්ධන සමිතියකට ලබාදී තිබූ රු.300,000 ක අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 **වාහන පාලනය**

------------------

(i) කැබ්රථ 03 ක ධාවන සටහන් වාහනය භාවිතා කරන නිලධාරියා විසින් කෙටිසන් නොකර ධාවනය කර තිබූ අතර, කිලෝ මීටර් 689 ක් සඳහා රු.13,775 ක් ඉන්ධන වැය කර තිබුණි.

(ii) දෛනික ධාවන සටහන් වල මුල් පිටපත් හා සාරාංශ වාර්තා විගණකාධිපති වෙත එවා නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

------------------------------------------

**අයවැය පාලනය**

-------------------

අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය
(ආ) කර්මාන්ත පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය

.